දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.

අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.

තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න



# තමිළිනීගේ කතාව 6

## කොටි අලිමංකඩ අත්පත් කරගනිති

1997-98 වසරවල දී කිලිනොච්චිය අත්පත් කර ගැනීමට දෙවතාවකටත් වඩා වැඩි වාර ගණනක් කොටි සංවිධානය මහත් උත්සායක යෙදුණි. එම උත්සාහයන්වල දී කළු කොටි ඇතුළු සිය ගණන් සටන්කාමීහු ජීවිතක්ෂයට පත්වූහ. 1998 වසරේ සැප්තැම්බර් මාසයේ ''නොනවතින රැල්ල'' දෙවන මෙහෙයුමෙන් කොටි සංවිධානය කිලිනොච්චිය අත්පත් කර ගත්තේය. මෙම යුද ගැටුම් දින තුනක් එක දිගට පැවැතිණි. පළමු දිනයේ දී කොටි සංවිධානයේ ප්‍රහාරක බළඇණි අත්පත් කර ගත් ප්‍රදේශයන් පසු දින නැවතත් හමුදාව විසින් අත්පත් කර ගන්නා ලදි. එම අවස්ථාවේ නායකතුමාගේ ප්‍රධාන අණදෙන මධ්‍යස්ථානයෙහි සිටි තමිල්චෙල්වන් වෙත නායකතුමා වැදගත් වගකීමක් පවරා ඇත. එය නම් සටන්වලට සම්බන්ධ වී සිටින සෙන්පතිවරුන්ගේ මානසික තත්ත්වය අවබෝධකර ගැනීමයි.

නායකතුමාගේ දැනුම්දීමට අනුව තමිල්චෙල්වන් ගොස් ප්‍රහාරක බළඇණි සේනාධිපතිවරුන් වන බාල්රාජ්, දීපන්, විදුෂා යන අය සමඟ කතාබස් කළ මොහොතේ ඔවුන් ප්‍රහාරය සාර්ථක වනු ඇතැයි යන්න පිළිබඳව එතරම් විශ්වාසයකින් නොසිටි බව දේශපාලන අංශයෙහි භාරකරු වන තමිල්චෙල්වන් නායකතුමා වෙත පවසා ඇත.

එය අසා මහත් කෝපයට පත් නායකතුමා ''මේ ප්‍රහාරය ජයග්‍රහණය කරවලා මම පෙන්වන්නම්'' යැයි මේසයට තදින් පහර දෙමින් පවසා ඇත. එයට පසුව සංවිධානයේ අලුත් වර්ගයෙහි මෝටාර් කාල තුවක්කු ප්‍රහාර හමුදාවට එරෙහිව එල්ලවන්නට වූ අතර කිලිනොච්චිය කොටි අතට පත්විය. මෙම සිද්ධිය එක්තරා රැස්වීමක දී තමිල් චෙල්වන් අපට පැවසුවේය. මෙම මෙහෙයුමේදී සටන්කාමී සහෝදරියන් ඇතුළුව පන්සීයකටත් වඩා අධික සටන්කාමියෝ ජීවිතක්ෂයට පත්වූහ. කිලිනොච්චියේ සිට පසුබැස ගිය හමුදාව වැඩි දුරක් නොගොස් පරන්තන් රසායන සංස්ථාව පිහිටි ස්ථානයෙහි කඳවුරු ළාගත්තේය.
1999 වසරේ මැද හරියේදී දේශපාලන අංශයෙහි කාන්තා ප්‍රහාරක බළඇණිය මන්නාරම් දිස්ත්‍රික්කයේ පල්ලෙමඩු සන්නාර් ප්‍රදේශයේ ලුතිතන් කර්නල් තනිකෙච් චෙල්විගේ නායකත්වයෙන් ස්ථානගත විය. අනපේක්ෂිත අයුරින් එම ප්‍රදේශය වැටලූ හමුදා මෙහෙයුම හේතුවෙන් සටන්කාමීයෝ පනහකටත් වඩා වැඩි පිරිසක් ජීවිතක්ෂයට පත්වූහ. එසේ මියගිය අය අතර ලුතිතන් කර්නල් තණිකෙච් චෙල්වි ද අයත්ය. ඇය යාපනයේ පලාලෙල ප්‍රදේශයේ උපන් තැනැත්තියකි. ආරම්භයේ දී ඇය ''සුදන්දිර පරවෛහල්'' අංශය සමඟ එක්ව කටයුතු කළ තැනැත්තියකි. 1989 වසරේදී වැලිඔය කැලෑවේදී කාන්තා බල සේනාවේ සිව්වන පුහුණු කඳවුරට සහභාගි වී ඇය ආයුධ පුහුණුව ලැබුවාය. දේශපාලන අංශයේ කටයුතුවලදී යාපනයේ සහ වන්නියේ කාන්තා අංශය භාරව කටයුතු කළ ඇය පසුව යාපනය බලා යන බල සේනාංකය මෙන්ම දේශපාලන අංශයේ ප්‍රහාරක බළඇණිය බාරවත් වගකීම් දැරුවාය. ඇයගේ මරණයට පසුව ප්‍රහාරක බළඇණියේ වගකීම් භාර තනතුරට ලුතිතන් කර්නල් ධාරණී පත් කළාය. ඒ දක්වා ඇය වගකීම් දැරූ දේශපාලන අංශයේ කාන්තා අංශය භාරව මාව ද පත් කෙරුණි. දේශපාලන අංශය යටතේ ක්‍රියාත්මක වූ කාන්තා අංශවල පරිපාලන ඒකක ඒකාබද්ධ කර ක්‍රියාත්මක කිරීමට සිදුව තිබුණි. ඒ සමඟ සමාජයේ කාන්තාවන්ගේ බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද අවශ්‍ය විය. සමාජයේ කාන්තාවගේ ජීවිතයේ අධ්‍යාපනික සහ ආර්ථික අංශවල යළි පිබිදීමක් ඇති කර ඔවුනට ජීවිතයේ උසස් මට්ටමකට ළඟා වීමට කටයුතු කළ යුතුය යන සිහිනය මා තුළ විය. නමුත් පරිපාලන ප්‍රශ්න කළමනාකරණය කිරීම සහ සංවිධානය සඳහා පිරිස් බලය එක් රැස් කිරීම අප සිදුකළ යුතු වැදගත් කටයුතු විය.

එයට පසුව 1999 වසරේ නොවැම්බර් මස දෙවන දින සංවිධානයේ සියලුම බලවත් බළඇණි ඒකාබද්ධ කර ජය සිකුරු හමුදා මෙහෙයුමට එරෙහිව ''ඕයාද අලෙෙගල්-03''(නොනවතින රැල්ල-03) නමින් විශාල ප්‍රතිප්‍රහාරයක් කොටි සංවිධානය විසින් ආරම්භ කරන ලදි. මුත්තෙයන්කට්ටු, සමලංකුලම්, මුල්ලියවලවෛ, තණ්ණිර්රුට්රු, කටුපුරප්පුල්වෙලි, කෝඩාලික්කල්, ඉත්තිමඩු යනාදී ප්‍රදේශ හරහා කොටි බළසේනා සටන් පෙරමුණු එක් කළේය. ''චෝට්සෙඩ්'' ක්‍රියාන්විතය මාර්ගයෙන් හමුදාව අත්පත් කරගැනීමට නියමිතව තිබූ ඔට්ටුසුට්ටාන් ප්‍රදේශය කඩාගෙන ඉදිරියට යෑම මෙහි අරමුණ විය. එම ප්‍රදේශයෙහි ලංකාවේ නාවික හමුදාව ස්ථානගතව උන්නේය.

මෙම සටනේ දී කොටින්ට මුලින් සැළසුම් කරගෙන සිටි ප්‍රදේශවලට වඩා වැඩි ප්‍රදේශයක් අත්පත් කරගත හැකි විය. එයට ප්‍රධාන හේතුවක් වූයේ කොටින්ට මිලිමීටර් 122 වර්ගයේ කාලතුවක්කු ලැබීමයි. එම කාලතුවක්කු ප්‍රහාර ඉතාමත් බලවත් විය. 1999 වසරේ නොවැම්බර් මස දෙවන දින ඔට්ටුසුඩ්ඩාන් කටාසිලවෛමඩු ප්‍රදේශයෙන් ආරම්භ වූ කොටි ප්‍රහාර එම මාසයේ හත්වන දින ඕමන්තෛහි පනික්කනීරාවි ප්‍රදේශ දක්වා වූ භූමි ප්‍රදේශය කොටින් අත්පත් කරගෙන තිබුණි.

1997 වසරේ මැයි මාසයෙහි සිට 1999 නොවැම්බර් මාසය දක්වා පැවැති ''ජය සිකුරු'' හමුදා මෙහෙයුම නිසා පමණක් කොටි සටන්කාමීහු 1500ක්ද හමුදාවේ තුන්දාහක්ද මිය ගිය බවට කොටි දැනුම් දුන්නේය. මේ අතර තමාගේ පාර්ශ්වයෙන් එක්දහස් තුන්සිය පනස් දෙනෙකු ජීවිතක්ෂයට පත්වූ බවත් භාර දාහක් තුවාල ලැබූ බවත් කොටින්ගේ පාර්ශ්වයෙන් තුන්දහස් හත්සිය දාහතරක් මරා දැමුණු බවත් එක්දහස් අටසිය අනූනව දෙනෙකු තුවාල වී ඇති බවත් ලංකාවේ හමුදාව දැනුම් දුන්නේය. ඒ අනුව සමස්ථයක් වශයෙන් ගත්විට ලංකාවේ දුප්පත් මවුවරුන්ගේ දරුවෝ දහස් ගණන් '9' මාර්ගයෙහි ද, වන්නියෙහි කැලෑවෙහිද කිසිවෙකුටත් යහපතක් නොසලස්වන යුද්ධයකදී තම ජීවිත අහිමි කර ගත්හ.

මෙම කාලවකවානුවේදී නායකතුමා වන ප්‍රභාකරන් නව බළඇණි කීපයක් ඇති කළේය. එහෙත් එම මොහොතේ වන්නියේ වාසය කළ දෙමළ ජනයාගේ දරුවෝ අවශ්‍ය පිරිස් බලය සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් නොවූහ. ''ඕයාද අලෛගල්''-මෙහෙයුමට පසුව ප්‍රහාරක බළඇණිවලට මඳ විවේකයක් ලබා දුන්නේය. මාලතී බළඇණියට අයත් සටන්කාමී සහෝදරියන්ටත් දින තුනක් අලම්පිල් මුහුදු වෙරළේ විශේෂ නිවාඩුවක් ගත කිරීමට සූදානම් කර තිබුණි. විශේෂ කෑම සපයා දීමත්, කලා වැඩසටහන්, මුහුදු ස්නානය ආදී වශයෙන් විනෝදයෙන් ගත කිරීමට අවස්ථාව සැළසුණි. නායකතුමා දිනපතා පැමිණ සටන්කාමීන් සමඟ කතාබස් කර පිටව යයි. එම දිනවල සෙන්පති ධුරය දැරූ විදුෂා සමඟ මම එහි උන්නෙමි. සටන් පෙරමුණේ විශේෂ දක්ෂතා දැක්වූ සටන්කාමීන්ට නායකතුමා බොහෝ තෑගි ලබාදුන්නේය. පරන්තන් සටනේදී තම ආර්පීජී ආයුධයෙන් හමුදාවේ යුද්ධ ටැංකියකට පහර දී

36 වන පිටට



සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com